ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2429/39 - 2025 මාර්තු මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2025.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙම නියෝගය මගින්, 2018 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 2104/5 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 වසරේ ඔක්තෝබර් මස 05 වැනි දිනැති අංක 1465/19 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය 2025 වසරේ අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එහි උපලේඛනයේ 9 වැනි අයිතමය වෙනුවට පහත දැක්වෙන නව අයිතමය ආදේශ කිරීම මගින් සංශෝධනය කරමි.

"09. යම් දේපොලක් බද්දට හෝ කුලියට දීමට අදාළ යම් සාධන පත්‍රයක්

(අ) කල් බදු ගිවිසුම (කුලී සින්නක්කර ගිවිසුම් හැරුණු කොට) සමන්විත මුළු කාලපරිච්ඡේදය සඳහා යම් අධි මිල ද ඇතුළුව එකතු කල් බද්ද හෝ කුලිය - එහි සෑම රු. 1,000 හෝ ඉන් කොටසක් සඳහා — රු. 20.00

එසේ වුවද කල් බද්දේ හෝ කුලියේ කාලපරිච්ඡේදය වසර 20 ඉක්මවන විට කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුම සමන්විත කාලපරිච්ඡේදය සඳහා එකතු කල් බද්ද හෝ කුලිය, කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුමෙහි පළමු වසර 20 සඳහා වන කල් බද්ද හෝ කුලිය ලෙස සලකනු ලැබිය යුතුයි.

(ආ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ එළඹ ඇති කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ගෙවිය යුතු මුළු වටිනාකමෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා — රු. 10.00

"

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 03 - 0291

1A - PG 7070 — 354 (2025/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*